


# මගේ දුවේ

පියවරුන් තම දියණියන්ට ගායනා කරන ලෙසින් ලියැවුණ ගීත කීපයක්ම අපේ සිංහල ගීත අතර තියෙනවා. පියෙකු හා දුවක ඇති බැඳීම වෙනම-මම අකාරයක බැඳීමක්. ඒ බැඳීම වත් පොහොසත් කම්, කුල හීන, කුලීනකම්, තරාතිරම්, උගත් නූගත්කම් වාගේ දේවල්වලින් තොරව කාටත් එක වගේ දැනෙන බැඳීමක්. ඒ නිසා මේ මිහිමත සිටින ඕනෑම පියෙකුට දැනෙන පොදු හැඟීම් පෙළක් කැටි වුණ ගීතයක මත ගොත විමසන්නට මෙවර " ගී සඳළුව" සූදානම් කළා.

ගීතය රචනා කළේ රත්න ශ්‍රී විජේසිංහ නම් වූ ප්‍රවීණ ගී පද නිබන්ධකයාණන්. ඔහුට දියණියන් දෙදෙනෙක්ම සිටිනවා. ගීතය ගායනා කළේ කරුණාරත්න දිවුල්ගනේ නම් වූ ප්‍රවීණ ගායන ශිල්පියාණන්. ඔහුටත් දියණියක් සිටිනවා. ඇය කලක් මෙල්බර්න් නුවරත්, අධ්‍යාපන කටයුතු සඳහා රැඳී සිටියා. ඒ අප අතර සිටිනා මහින්ද දිසා-නායක දිවුල්ගනේ සහෘදයාගේ නිවසේ. ඒ ගම් පළාතේ නෑ සම්බන්ධකම්... ගීතය "මගෙ දුවේ" ගීතයයි. ජූනි මාසයේ අටවනදා පැවැත්වෙන "තරු එළිය දිගේ" ප්‍රසංගය සඳහා කරුණාරත්න දිවුල්ගනේ ශිල්පියාණන් පැමිණීමට නියමිතයි. ඒ නිසාවෙන් "මගේ දුවේ" ගීතය ගැන යමක් දැන



මගෙ දුවේ ඔබ අවදියෙන් නම්
මේ රැයේ මිහිරිම වෙලාවයි
දොර ඇරන් එළියට ආවොතින්
මේ මිහිරි දේවල් නුඹට මයි

සේපාලිකා මල් බිමට බැහැලා
ඇවිදින්න යන වෙලාවයි
නිල් තාරකා බිම බලාගෙන
වැව් දියට පෙම් බැඳි වෙලාවයි
මේ ලොව කෙතරම් සුන්දරද?
මගෙ දුව තනියම හිනාවෙයි.....

ගන කළුවරට අපි පෙම් කළොත්
ඉර හඳ තරුවලට ණය ගැතියි
ලොව දුන්න දේවල් අප අපට
හෙට ලොවට පෙරළා දිය යුතුයි
ඔබ මේ ලොවට ආදරේ නම්
මුළු ලොවම නුඹටත් ආදරෙයි.

රචනය - රත්න ශ්‍රී විජේසිංහ
තනුව හා සංගීතය - රෝහණ වීරසිංහ
ගායනය - කරුණාරත්න දිවුල්ගනේ

ගැනීමට අප ඔහුව දුරකථනයෙන් සම්බන්ධ කරගත්තා.

වගකිව යුතු නිලතලවල අවිවේකය අතරින් වුවද දිවුල්ගනේ ශිල්පියාණන් "ගී සඳළුව" වෙනුවෙන් කාලයක් වෙන් කිරීමට සතුටු වුණා. සුපුරුදු විදියටම "දිවුල් අයියා" ගේ සිනහව අපට දුරකථනයේ මව් බිම කෙළවරින් ඇසුණා.

"ඇත්තටම මගේ දුව ගැන හිතලයි මම මේ ගීතය තෝරා ගත්තේ. මම හුඟ කාලයක ඉඳලා දුවක් ගැන කියවෙන පද රචනාවක් හොය හොයාමයි හිටියේ. රත්න ශ්‍රී ටත් මම කිව්වා දුවක් ගැන හොඳ ගීතයක් ලියලා දෙන්න කියලා..... ඉතින් රත්න ශ්‍රී මට මේ ගීතය ලියලා දුන්නා. හැබැයි රත්න ශ්‍රී කියන්නේ මේ ගීතය ලිව්වේ එයාගෙ දුවලා ගැන හිතලා කියලයි.... "දිවුල් අයියා" ගේ

සුපුරුදු සිනහව ආයෙමත්!

"මට හිතෙන්නේ මේ ගීතය මගේ දුවටත් හරියටම ගැලපෙනවා කියලා. ඒක තමයි සිසිර මේ ලෝකේ ස්වාභාවය. මේ ලෝකේ ඉන්න ඕනෑම තාත්තා කෙනෙකුට දුවක් ගැන තියෙන හැඟීම් එක වගෙයි. දැන් ඔයාටත් දුවක් ඉන්නවානේ. ඉතින් ඔයාට වුණාත් මේ රත්න ශ්‍රී ටයි මටයි දැනෙන දේ දැනෙනවා ඇති. ඇත්තටම ඒක නේද මේ ගීතය ගැන තෝරාගන්න හේතුව? ඒ හන්දා නේද මේ ගැන මගෙන් අහන්නේ?"

අප කොහේ ජීවත් වුනත් අපගේ හැඟීම් එකම නොවේද කියා සිතෙයි. කුමන වයසේ දුවක් වුණත් ඇයගේ සුරතල් කුඩා කාලයට අප හට සැණයකින් යන්නට පුළුවන්.

"මේ පද ටික ඇහෙනකොට මට මගේම කුඩා කාලයක් මතක් වෙනවා. මම තුනේ-හතරේ පන්තිවල ඉන්න කාලේ මං අහපු කවි පෙළක් වචන හරියටම මේ වාගේ කියලා හිතෙනවා."

"සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොල පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොතරම් ලස්සන ද රෑට?"

මේ කවි පෙළ ලියලා තියෙන්නේ එස්. මහින්ද හාමුදුරුවෝ. ඉතින් රාත්‍රිය ගැන, රාත්‍රියේ සුන්දරත්වය ගැන කියවෙන මේ වගේ කවි ගණනාවක්ම මේ කවි පෙළේ තියෙනවා. ඉතින් ඒ රසය අදට වුණත් විඳින්න පුළුවන් රෑට එළියට බැස්සම."

ගීත ගායනයට පමණක්ම සීමා වුණ ගායකයෙක් නොවේ, කරුණාරත්න දිවුල්ගනේ ශිල්පියාණන්. නිර්මාණයක් රස විඳින්නට ඔහුට ඇති උනන්දුවක්, හැකියාවත් ඉමහත් පරිසර හිතකාමියෙක් විදියටත්, සෞන්දර්යවාදියෙක් විදියටත් ඔහු දරණ අදහස් බෙදා හදා ගන්නට හෝරා ගණන් මව් බිමේ දුරකතන රත් කරපු හැටි සිහිපත් වෙයි.

"මගේ කුඩා කාලයෙන් පස්සේ මට මත්ක වෙන්නෙ මගේ දුවගේ කුඩා කාලය. සමහර දාට රෑ වුණාම මම දුවත් වඩාගෙන එළියට බහිනවා. ඉතින් මේ පද මාලාවේ තියෙන්නෙත් ඒ ටිකමනේ. අපේ ස්වාභාවික පරිසරයේ තියෙන සුන්දරකම දුවට ඒ දවස්වල ඉඳන්ම ටික ටික හරි දැනෙන්න ඇති. ඒ එක්කම එයාගේ ලෝකය සුන්දර වෙන්න ඇති. එයා විතරක් නෙවෙයි. අපිත් ඒ දේවල් වින්දානේ. මේ අත්දැකීම අනිවාර්යෙන්ම රත්න ශ්‍රීටත් තියෙන්නෙ ඇති. නැත්නම් මෙහෙම ලියවෙන්නෙ නෑනේ."

"දිවුල් අයියා" මේ කියන්නේ අපගේත් කතාව නේදැයි සිතෙයි. මව් බිමේ විතරක් නෙවෙයි, වෙන රටවල්වල පවා ජීවත්වන පියවරුන්ට මේ දෙය පොදු අත්දැකීමක් නේද?

"මට මේ වගේ දැණුන තව ගීතයක් තමයි සුනිල් එදිරිසිංහ මහත්තයා ගායනා කරන " චන්ද්‍ර මණ්ඩලේ" ගීතය. හරිම ප්‍රබල පද පෙළක්. අත්දැකීමක් කාටත් පොදු වෙන විදියට ලිව්වමයි ඒක හුඟ දෙනෙක් අතරට යන්නේ. මගෙ දුවේ ඒ වගේ පද පෙළක්"

මේ දිවුල් අයියාගේ හැටි. තමන්ට දැනෙන දේ කෙළින්ම කියනවා. සමහර විට අප අතින් ලියැවී ඔහු ගායනා කළ ගීතයකට වඩා ඔහු අගය කරන්නේ අප අතින්ම ලියැවී වෙනත් ශිල්පියෙ හරි ශිල්පිණියෙක් හරි ගායනා කළ ගීතයක්. ඒ ගැන ඔහු දිගින් දිගටම කතාකරන්නේ කිසිම ලෝබකමකින් තොරව. වරක් කොළඹ මහජන පුස්තකාලයේදී පැවැත්වුණ සංගත තැටි එළිදැක්මක් නිවා වී අපව තමන්ගේ වාහනයෙන් නිවසට හැරලන අතරේ ඔහුනේ ලැබුණ ගුරු හරුකම් අදත සිහිවෙනවා. එදා දිවුල් අයියාගේ මාතෘකාව වූයේ "නවකයින්ට අත හිත දීමත් ඔවුන් වෙනුවෙන් රචනා කිරීමේදී වැදගත් වන කාරණාවක් ගැනත්."

"දැන් අපේ දුවලා ලෝකයෙන් ලබාගත් දේවල් ලෝකයට දෙන්න ඕන කාලය ඇවිල්ලා. ඉතින් අපේ යුතුකම ලෝකයට ආදරය කරන දුවක් හදලා එයාලගේ යුතුකම් මතක් කරලා දෙන එකයි. එයාලා ලෝකයට යමක් දුන්නොත් මුළු ලෝකයම එයාලටත් ආදරය කරාවි."

කරුණාරත්න දිවුල්ගනේ ශිල්පියාණන් පිළිසඳර නිමා කළේ සුහද පිළිසඳරකටත් මුල පුරමින්. ගී සඳළුව පාඨකියන් වෙනුවෙන් අවසානයේ අපි ඔහුට ස්තුතිවන්ත වුණා.

දියණියක වෙනුවෙන් අපෙන් විය යුතුකමක්, අප දියයුතු උපදේශයත් රත්න ශ්‍රී විජේසිංහයන් අතින් නිරවුල්ව නිවැරදිව ලියැවිලා. විසි වසරකට පස්සේ අපටත් ඒ ගැන සිහි කැඳවන්නට මෙම පද වැලත්, රෝහණ වීරසිංහයන්ගේ හැඟීම් දනවන තනු හා සංගීත නිර්මාණයක්, කරුණාරත්න දිවුල්ගනේ ශිල්පියාණන්ගේ මියුර ළයාන්විත කටහඬත් සමත් වුණා.





